# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| **තනතුර, සේවා ගණය, පුරප්පාඩු සංඛ්‍යාව** | **සුදුසුකම්** | **අනෙකුත් අනිවාර්යය අවශ්‍යතා** | **වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය** | **සටහන** | **වයස් සීමාව** |
|---|---|---|---|---|---|
| ප්‍රධාන රියදුරු (භාරත යාත්‍රා)<br><br>සේවා ගණය අධි ශ්‍රේණිය 6 : 3 (SG3)<br><br>01 | දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම<br>**සහ**<br>1907 ලෝන්චි ආඥා පනත යටතේ ශ්‍රී ලංකා වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන අශ්වබල 1000 (750KW) ට නොඅඩු ධාරිතාවයකින් යුත් සහතිකය<br>**සහ**<br>යාන්ත්‍රික හෝ නාවික ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණික සහතිකය (NCT) හෝ රජයේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන තුන් (03) අවුරුදු පූර්ණ කාලීන පාඨමාලා සහතිකය හෝ ඒ හා සමාන සහතිකය<br>**සමග**<br>**පළපුරුද්ද**<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ප්‍රධාන රියදුරු (භාරත යාත්‍රා) හෝ ඒ හා සමාන තනතුරක වසර තුන (03) ක පළපුරුද්ද. | බඳවා ගැනීමෙන් පසු වසරක සේවා කාලය තුළ ගිනි නිවීම හා ගිනි වැළැක්වීම, සාමාන්‍ය ආරක්ෂාව – ප්‍රථමාධාර, නාවික ඉංග්‍රීසි හා පුද්ගල ආරක්ෂක ශිල්ප ක්‍රම පිළිබඳ පාඨමාලා හඳුරා සහතික ඉදිරිපත් කළ යුතුය | 6 : 3 (SG3)<br><br>මූලික වැටුප් පියවර : රු.53425 /=<br><br>වාර්ෂික වේතනාධිකය : රු. 1150/=<br><br>(දළ වැටුප මාසිකව රු. 128,000/= ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය | අවුරුදු 18 – 45 අතර විය යුතුය.<br>(රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

**වෙනත්**

**සෑම අයදුම්කරුවෙකුම,**

i. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

iii. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

iv. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.

v. රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තුමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තුමේන්තු / සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

**සැ.යු.** 2016.12.01 දිනැතිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 28/2016 චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව ඉහත බඳවාගැනීම් පරිපාටිවල තාක්ෂණික හා කාර්මික අංශවල තනතුරු සඳහා බඳවාගැනීමේදී වෘත්තීය සුදුසුකම් ලෙස NVQ 3 හෝ NVQ 4 හෝ සමග අධ්‍යාපන සුදුසුකම් ලෙස අ.පො.ස. (සා.පෙළ) හෝ අ.පො.ස. (උ.පෙළ) හෝ ඇතුළත් කර ඇති අවස්ථාවකදී NVQ 3 හා NVQ 4 සුදුසුකම් ලබා තිබීම පිළිවෙලින් අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග සමත්වීම හා සමාන ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම හා ලිපිනයන් සහිතව සකස් කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2026.06.22 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. අදාළ **අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන),**
**මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාසය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.**